**ඒරාවූර් නගර සභාව - 2022**
**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඒරාවූර් නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ඒරාවූර් නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා පරිපාලන බලප්‍රදේශයේ පිහිටි සන්නිවේදන කුළුණු 05 කින් අය විය යුතු ව්‍යාපාර බදු ආදායම් රු.30,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ජ'නල් සටහන් මාර්ගයෙන් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගැලමට පියවර ගෙන ඇති බව. | වර්ෂයට අදාළ ආදායම් ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.52,525,635 ක් වටිනා ගිණුම් ශේෂ 06 ක් හිමිකම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛන සහ වටිනාකම සහිත උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. | ලේඛන යාවත්කාලීන කර ඇති බව සහ ඔප්පු ලබා ගැනීමට කටයුතු කරන බව. | අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවූ අවස්ථාවන් පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නගර සහා ආඥා පනතේ (255 අධිකාරිය) | | | |
| (i) | 44, 46 හා 49 වගන්ති සහ මඩකලපුව දිස්ත්‍රික් පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2013 ජූලි 10 දිනැති අංක BT/ACLG/PL/Road/ 2013දරන ලිපිය | සභාව සතු මාර්ග ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර නොතිබුණි. | සියලුම මාර්ග ගැසට්පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට සභාව විසින් වර්තමානයේ කටයුතු කරමින් පවතින බව. | සියලුම මාර්ග ගැසට්පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 170(1) හා (2) වගන්ති සහ නගර සභා රීති මාලාවේ (පරිච්ඡේදය III) 54(3) රීතිය | රු.10,000 ට වැඩි හිඟ ශේෂ පවතින දේපළ බදු නොගෙවූ දේපළ හිමිකරුවන් 50 ක ගෙන් හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ හිඟදේපළ බදු අයකිරිමට පියවර ගෙන ඇති බව. | පනතේ විධිවිධාන අනුව වරිපනම් බදු අයකිරීමට පියවර ගත යුතුය. |
| (iii) | 171 වගන්තිය | හිඟ හිටි වෙළෙඳ බලපත්‍ර ගාස්තු සහ හිඟහිටි වරෙන්තු ගාස්තු අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. | වර්තමානයේ කටයුතු කරමින් පවතින බව. | පනත ප්‍රකාරව විධිමත් අනුමැතියක් සහිතව කපාහැරීමට කටයුතු කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 | සභාවේ 1988 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ලබාදී තිබුණු අත්තිකාරම් පියවා නොතිබුණි. | වර්තමානයේ අත්තිකාරම් හඳුනාගෙන කපාහැරීමට ප්‍රධාන ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතින බව. | අත්තිකාරම් මුදල් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1915 අංක 15 දරන නිවාස හා නාගරික සංවර්ධන ආඥාපනතේ 19 වගන්තිය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා වන අත්පොතේ **04** වන පරිච්ඡේදයේ **4.2** (උ) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි අයදුම් පත් 15ක් සඳහා සෞඛ්‍ය වෛද්‍ය අධිකාරවරයාගේ නිර්දේශ රහිතව ගොඩනැගිලි ඉදි කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. | 1915 අංක 15 දරන නිවාස හා නාගරික සංවර්ධන ආඥාපනත ප්‍රකාරව ක්‍රියාත්මක කරන බව. | පනතේ ප්‍රකාරව, සෞඛ්‍ය හා පරිසර සම්බන්ධ නිර්දේශ ලබාගැනීමෙන් පසුව පමණක් ගොඩනැගිලි අනුමැතිය ලබාදිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,726,921ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 12,946,800 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදාය | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදාය | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 11,311,941 | 11,877,209 | 12,035,594 | 20,632,517 | 9,358,200 | 8,308,200 | 5,918,057 | 20,790,901 |
| කුලී | 14,130,400 | 4,898,114 | 4,580,713 | 5,973,759 | 2,611,100 | 107,300 | 107,300 | 5,656,359 |
| බලපත්‍ර ගාස්තු | 3,650,000 | 2,754,705 | 2,754,705 | -- | 5,050,000 | 2,669,210 | 2,669,210 | -- |
| වෙනත් ආදායම් | 27,589,466 | 104,341,012 | 97,998,214 | 9,661,378 | 117,108,000 | 59,218,693 | 58,730,386 | 3,318,581 |
| | 56,681,807 | 123,871,040 | 117,369,226 | 36,267,654 | 134,127,300 | 70,303,403 | 67,424,953 | 29,765,841 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීම් කාර්යසාධන පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 වර්ෂයේ සිට පවතින කුකුළු මස්කඩ 15ක කසල ඉවත් කිරීමේ හිඟහිටි බදු රු.322,500 ක්, වසර 05 ක සිට පවතින විනෝද බදු රු.177,856 ක් සහ 2012 වර්ෂයෙහි හිඟ මස්කඩ කුලී රු.483,979 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලිපිලේඛන නොමැති වීම, ගෙවිය යුතු අය විදේශගත වීම සහ මිය යාම හේතුවෙන් අය කර ගැනීමට ගැටලු පැන නැගී ඇති බව. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.7,993,590 ක් සහ මුද්දර ගාස්තු රු.6,036,000 ක් විය. | පිළිතුරු ලැබී නොතිබුණි. | මුද්දර ගාස්තු සහ උසාවි දඩ ගාස්තු ආදායම් ගෙන්වා ගැනිමට පියවර ගත යුතුය. |
| (ii) | උපලේඛන නොගැළපීම සහ බැංකුවේ තැන්පත් කළ බවට ලියකියවිලි නොමැතිවීම වැනි හේතු නිසා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ලැබිය යුතු පසුගිය වර්ෂ 05ට අදාල මුද්දර ගාස්තු රු.3,201,500ක් ප්‍රතිපූර්ණය කර ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිතුරු ලැබී නොතිබුණි. | මුද්දර ගාස්තු ආදායම් නියමිත කාලයේ ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් අනවසර ගොඩනැගිලි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට කොට්ඨාශයේ නිලධාරීන් 04ක් පත්කර සමාලෝචිත වර්ෂයේ වැටුප් ලෙස රු.850,525ක් ගෙවා තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ අනුමැතියකින් තොරව ඉදිකළ ගොඩනැගිලි 09ක් සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | වර්තමානයේ මේ සඳහා කොට්ඨාශ සාමාජිකයින් පත්කර තොරතුරු රැස්කරමින් පවතින බව. | අනවසර ගොඩනැගිලි සම්බන්ධයෙන් නීතිමය පියවර ගත යුතුය. |
| (ආ) | **අධිකාරි බලය නොලත් කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන්** | | |
| (i) | මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය සහ මධ්‍යම පරිසර අධිකාරිය ආදියෙහි පූර්ව අනුමැතිය නොලැබීම හේතුවෙන් මෙම කාර්යාල ගොඩනැගිල්ල අනුමත නොකළ ගොඩනැගිල්ලක් ලෙසට සලකා තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, අදාල අධිකාරිය මේ පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබූ විට සභාවට දඩගාස්තු ගෙවීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය. | මේ පිළිබඳ ලිපිලේඛන කොළඹ පිහිටි ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇත. UDA, RDA සහ මධ්‍යම පරිසර අධිකාරිය ආදියෙන් අනුමැතිය ලබාගැනිමට කටයුතු කරන බව. | මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය සහ මධ්‍යම පරිසර අධිකාරිය ආදියෙහි අනුමැතිය ලබාගැනිමට කටයුතු කළ යුතුය. |
| (ii) | පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් සැලැසුම් කළ අවශ්‍යතාවට අතිරේකව ඉදිකළ ගොඩනැගිලි කොටසට හේතුව මේ දක්වා පැහැදිලි නොකළ අතර එම ගොඩනැගිල්ලේ 2වන මහලේ ඉහළ කොටස අංගසම්පූර්ණ ලෙස ඉටු නොකිරීම නිසා ජල කාන්දුවක් සිදුවී ගොඩනැගිල්ල භාවිතා කිරීමට නොහැකි වී තිබුණි. | ගොඩනැගිල්ලේ අඩුපාඩු සහ රජයේ දේපළ වංචා කිරීම සම්බන්ධයෙන් වාර්තා කර ඇත. මෙම කාර්යය සඳහා අරමුදල් ලැබූ විට කාර්යයන් සම්පූර්ණ කරන බව. | ගොඩනැගිලි ඉදිකිරීම අංග සම්පූර්ණ ලෙස ඉටු කිරීමට පියවර ගත යුතුය. |
| (iii) | පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම්කාරක සභාව විසින් විමසනු ලැබූ අදාල ගොඩනැගිල්ල පිළිබඳ අනුකූලතා සහතිකය වර්ෂ 06කට අධික කාලයක සිට ඉදිරිපත් කර නොතිබුණි. | අදාල වාර්තාව මඩකලපුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුවරයාගෙන් ලැබුණු විගස යවන බව. | ගොඩනැගිල්ල සම්බන්ධ අනුකූලතා සහතිකය ලබාගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | අදාල ගොඩනැගිලි අධීක්ෂණය මගපෙන්වීම් සුදුසුකම්ලත් ඉංජිනේරු නොවන පුද්ගලික ආයතන අධීක්ෂකවරයෙකු විසින් අධීක්ෂණය කර තිබුණි. | ඉහත කාර්යය රාජ්‍ය ප්‍රතිපත්තිවලට හා ව්‍යාපාරික ආචාර ධර්මවලට පටහැනිවත්, රජයේ මුදල් නාස්ති කර තම ස්වකීය ලාභ ප්‍රයෝජන වෙනුවෙන් ඒවා වැරදි ක්‍රම මගින් අනුමත කර ලබාගැනිමට සිදුකළ උත්සාහයක් යැයි සැකයක් පවතින බව. | ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යයන් සුදුසුකම්ලත් ඉංජිනේරුවරයෙකු විසින් අධීක්ෂණය කළයුතු වේ. එසේම, පාඩු අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනිමට පියවර ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 වර්ෂයේ කුලියට දුන් සංස්කෘතික ශාලාවේ ගිවිසුම් කාලය අවසන් වී වර්ෂ 14ක් ඉක්ම ගොස් තිබුණි. එසේ වුවත් ගිවිසුම් ප්‍රකාරව කුලී මුදල් ලැබී නොතිබූ අතර මෙම සංස්කෘතික ශාලාව නැවත සභාවට භාරගෙන කුලියට ලබාදීමට සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මේ හේතුවෙන් සභාවට මේ දක්වා රු.2,204,000ක පාඩු සිදුවී තිබුණි. | ගිවිසුම් අවසන් කර කුලි අයකර ගැනීමේ ක්‍රියාමාර්ග අඛණ්ඩව සිදුකරමින් පවතින බව. | දේපළවලින් උපරිම ආදායම් ලබාගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | සභාවේ දෝෂයට ලක්වූ වාහන 04 ක් අළුත්වැඩියා කිරීමට සහ භාවිතා කළ නොහැකි තවත් වාහන 04ක් ඉවත් කිරිමටත් සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | වාහන අළුත්වැඩියා කිරීමට සහ භාවිතා කළ නොහැකි වාහන 04 සඳහා ලංසු කැඳවීමටත් කටයුතු කරමින් පවතින බව. | වාහන අළුත්වැඩියා කිරීමට සහ භාවිතා කළ නොහැකි වාහන ඉවත් කිරිමටත් පියවර ගත යුතුය. |

### 3.3 ව්‍යාපෘති, ක්‍රියාකාරකම් සහ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2001 වර්ෂයේ රු. මිලියන 10ක් පමණ වියදමින් ඉදිකර අවසන් වූ ප්‍රධාන මාර්ගයේ පිහිටි කඩකාමර 64කින් යුත් වෙළෙඳපොල ගොඩනැගිලි සංකීර්ණය මේ දක්වා මහජන භාවිතය සඳහා විවෘත නොකර හා කිසිදු කුලී ආදායමක් ඉපැයීමකින් තොරව වසා දමා තිබුණි. | වර්තමානයේ LDSP ව්‍යාපෘතිය යටතේ අදාල වෙළෙඳපොල සංකීර්ණයේ සිදුකරන මාළු වෙළෙඳ සැල් ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු මහජන භාවිතය සඳහා භාරදී සභාව විසින් ආදායම් ඉපැයීමට කටයුතු කරන බව. | වත්කම් භාවිතා කර ආදායම් ඉපැයීමට පියවර ගත යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු සහ අතිරික්ත**<br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ කාර්යමණ්ඩල ලැයිස්තු ප්‍රකාරව, සභාවේ පැවැති තනතුරු 19ක් සඳහා පුරප්පාඩු 41ක් සහ අතිරික්තව සේවකයින් 06ක් පැවැතුණි. | පුරප්පාඩු සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉල්ලීම් යැවීමට කටයුතු කරමින් පවතින බව. | පුරප්පාඩු පිරවීමට සහ අතිරික්ත කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත් පියවර ගත යුතුය. |
| (ආ) | **සේවක ණය**<br>විශ්‍රාම ගිය නිලධාරීන් පස්දෙනෙකුගේ සහ සේවය අත්හිටවූ නිලධාරීන් දෙදෙනෙකගෙන් රු.261,914 ක් වර්ෂ 03කට අධික කාලයක සිට අය කර ගත යුතුව පැවැතුණි. | විශ්‍රාම ගිය සහ සේවය අත්හිටවූ නිලධාරීන්ගෙන් හිඟ ණය ශේෂ අයකිරීමට පියවර ගෙන ඇති බව. | හිඟහිටි සේවක ණය අයකිරීමට පියවර ගත යුතුය. |

# 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික අයවැය ප්‍රකාරව, සභාව විසින් ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම් 43ක් සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කරන බව. | අයවැය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කළ යුතුය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 133 සහ 134 හි විධිවිධාන ප්‍රකාරව, සභාවේ අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරියෙකු පත්කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක වන බව. | අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කිරිමට කටයුතු කළ යුතුවේ. |

**4.3 පාරිසරික ගැටළු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1988 අංක 56 දරන පනතින් හා 2000 අංක 53 දරන පනතින්, 2008 අංක 01 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන විශේෂ ගැසට් පත්‍රයේ “ආ” වගන්තිය ප්‍රකාරව ඝාතකාගාර සහ ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන පරිසර බලපත්‍ර සභාව විසින් ලබාගෙන නොතිබුණි. | ඝාතකාගාර සහ ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන පරිසර බලපත්‍ර ලබා ගැනීමේ කටයුතු ක්‍රමානුකූලව සිදුවෙමින් පවතින බව. | පනතේ ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතුය. |
| (ආ) | අංක 2264/18 දරන විශේෂ ගැසට් පත්‍රයේ “ඇ” වගන්තිය ප්‍රකාරව, හෝටල් හෝ ආපනශාලා, කෑම පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර බෙදාහැරීමේ සේවා වැනි ආයතන 92 කට පාරිසරික බලපත්‍ර නිකුත් කිරීම හෝ ඔවුන්ගේ ආයතන විධිමත්ව ක්ෂේත්‍ර පරීක්ෂාවක් කිරීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඇතැම් අය පමණක් පාරිසරික බලපත්‍ර ඉල්ලා අයදුම් කර ඇත. ඔවුන්ට බලපත්‍ර නිකුත් කිරිම සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂාව වර්තමානයේ සිදුකෙරෙමින් පවතින බව. | පාරිසරික බලපත්‍ර නියමිත පරිදි නිකුත් කිරිමට පියවර ගත යුතුය. |